## විශාඛා විද්‍යාලයේ පාංශුකූලය

පසුගිය පාප්තුමා අභාවප්‍රාප්තවීමෙන් පසුව කොළඹ විශාඛා විද්‍යාලයේ ඒ නිමිත්තෙන් පාංශුකූලයක් දුන් බව ඇතැම් ජනමාධ්‍යයන්ගෙන් ප්‍රකාශවිණි. ඒ සම්බන්ධයෙන් සියළු තොරතුරු අදාළ ජනමාධ්‍යයන්හි සඳහන් නොවුණ ද බොහෝ දෙනා අද වන විට ඇතැම් තොරතුරු දන්නා බව පැහැදිලි ය. කැබිනට් රහස් යැයි කියන දෑ රහස් නොවන රටක මෙවැනි විස්තර ජනතාවගෙන් වසන්කළ හැකි නො වෙයි.

මේ ඊනියා පාංශුකූලය අභාවප්‍රාප්ත පාප්තුමාගේ අන්තිම කැමති පත්‍රය අනුව සිදුකළ එකක් නොවන බව පැහැදිලි ය. එතුමා වසර කිහිපයකට පෙර ලංකාවට පැමිණීමට ඔන්න මෙන්න කියා තිබියදී බුදුදහමට කැළැලක් වන ප්‍රකාශයක් ද කෙළේ ය. ඒ පිළිබඳව එතුමා ලංකාවේ දී බෞද්ධයන්ගෙන් සමාව ගන්නා බවක් කියැවුණ ද එවැන්නක් සිදු නොවුණු බව සිංහල බෞද්ධයෝ දනිති. ඉස්ලාම් ආගම පිළිබඳව එවැනි ප්‍රකාශයක් කර මුස්ලිම් රටකට යෑමට පාප්තුමකුට නොහැකි වුව ද අන්තවාදීන් ජාතිවාදීන් ආගම්වාදීන් ආදී වශයෙන් සැලකෙන, සුළුතරය පාගාදමා ඇතැයි කියන, සිංහල බෞද්ධයන් සිටින රටට  පැමිණ ආපසු යෑමට පාප්තුමාට බාධාවක් නො වීය. අභාවප්‍රාප්ත  පාප්තුමා එතුමන් දැරූ මතය අනුව ස්වර්ගස්ථ විය යුතු ය. පුනරුත්පත්තියක් ලැබී ස්වර්ගයේ නැවත ඉපදුණ ද, සංසාරයේ සැරිසරන බලාපොරොත්තුවක් එතුමන්ට තිබෙන්නට නැත. කෙසේ වෙතත් දුක ගැන කතාකරන ආගමක් ලෙස එතුමන් විසින් හඳුන්වනු ලැබූ බුදුදහමට අනුකූලව එතුමන් පින් පෙත් බලාපොරොත්තුව සිටියේ යැයි කිව නො හැකි ය.

ඔලාපොරොත්තුවක් තිබුණත් නැතත් එතුමන්ට පින් පෙත් පැමිණවීමේ වරද කුමක්දැයි ප්‍රබුද්ධයකු ප්‍රශ්න කිරීමට ඉඩ ඇත. පින් පෙත් බලාපොරොත්තු වුවත් නැතත් පින් පෙත් ලබාගත්තත් නැතත් පින් පෙත් දීමෙහි ගැටළුවක් නැත. ඕනෑම බෞද්ධයකුට අවශ්‍ය නම් පාප්තුමාට නොව දෙවියන් වහන්සේට වුව ද පින් දිය හැකියැයි යමකුට තර්කකළ හැකි ය. එහෙත් ප්‍රශ්නය එය නොව මේ සඳහා විශාඛා විද්‍යාලය තෝරාගනු ලැබුවේ ඇයි ද යන්න ය.

විශාඛා විද්‍යාලය අද රජයේ පාසලක් වෙයි. රජයේ පාසලක මේ ආකාරයෙන් පින් පෙත් පැමිණවීම අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිය දැයි අපි නොදනිමු. දැනට ටික කලකට උඩ දී අපවත් වූ මල්වතු පාර්ශ්වයේ මහානායක හිමි වෙනුවෙන් රජයේ පාසලක මතක වස්ත්‍ර පූජාවක් සිදුකළ බවක් වාර්තා නො වීය යනු මගේ අදහස වෙයි. ඇතැම් විට රජයේ පාසලක උන්වහන්සේගේ ආත්මය වෙනුවෙන් පූජාවක් පවත්වන්නට ඇත. කෙසේ වෙතත් ඒ පිළිබඳ ව ජනමාධ්‍යයක කිසිම ප්‍රවෘත්තියක් පළවූ බවක් මට මතක නැත. මේ සම්බන්ධයෙන් මගේ මතකය නිවැරදි නොවීමට ඉඩ ඇති බැවින් ප්‍රබුද්ධයකු හෝ අන් අයකු හෝ ඒ නිවැරදිකරන්නේ නම් කෘතඥ වෙමි.

ඇතැම් විට අපවත් වූ මල්වතු මහානායක හිමියන්ට කෙසේ වෙතත් පාප්තුමාට පින් අවශ්‍ය යැයි අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරියකු හෝ නිලධාරිනියක හෝ තීරණය කරන්නට ඇත. මේ නිලධාරීන්ට හා නිලධාරිනියන්ට ඉහළින් සිටින එකම ඇමතිවරයා ජනාධිපතිනිය බැවින් මොවුන්ගේ තීරණ ගැන ප්‍රශ්නකිරීමට අධ්‍යාපනය පිළිබඳ නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනාම මැළිකමක් දක්වති. මේ නිලධාරිනියන් නිතර කතාකරන්නේ ඊනියා දියුණු රටවල තත්ත්වයට මෙරට අධ්‍යාපනය නගාසිටවීමට ය. ඊනියා දියුණු රටවල අධ්‍යාපනය අපට අවශ්‍ය යැයි මම නො කියමි. එවැනි අධ්‍යාපනයක් පියදාස සිරිසේන මහතාගේ උගත්කම ගැන ප්‍රශ්නකරන ඕනෑම කාල් (1/4) මාක්ස්වාදියකුගේ සිට ඕනෑම කසිකබල් නූතනවාදියකු හෝ ඊනියා පශ්චාත්නූතනවාදියකු හෝ දක්වා අගයකරනවා විය හැකි ය. ඊනියා දියුණු රටවල අධ්‍යාපනය කෙසේ වෙතත් එවැනි රටවල නිලධාරික්‍රමය නම් මේ නිලධාරිනියෝ අනුගමනය කරති. අපේ රටේ ජනතාව ඡන්දයෙන් පත්කරගන්නා නියෝජිතයන්ට වඩා මේ නිලධාරිනියන් හා නිලධාරීන්  බලවත් වන්නේ ඇමරිකානු එක්සත් ජනපදයේ රාජ්‍ය ලේකම්වරිය සිහිගන්වමනි. එහෙත් ඒ රාජ්‍ය ලේකම්වරියට නම් ඔවුන්ගේ සංස්කෘතියෙහිවත් මැනෙන උසස් බුද්ධියක් වෙයි.  අර කාල් මාක්ස්වාදියාටත් මේ නිලධාරිනියන් සමග එකතු වී උගත් ගැමි තරුණ පරපුරක් ඇතිකිරීම සඳහා පියදාස සිරිසේන මහතාට විරුද්ධ ව්‍යාපාරයක් ඇරඹිය හැකි ය.

විශාඛා විද්‍යාලයේ පාප්තුමා වෙනුවෙන් පාංශුකූලය දීමට පෙර අධ්‍යාපන අමාත්‍යාංශයට අවශ්‍ය වී ඇත්තේ එය කොළඹ ආනන්ද විද්‍යාලයෙහි දීමට ය. එහෙත් එවකට ආනන්ද විද්‍යාලයෙහි පැවති තත්ත්වය හේතුකොටගෙන අමාත්‍යාංශය විසින් පාංශුකූලය විශාඛා විද්‍යාලයේ දීමට තීරණය කෙරී ඇත. ඒ සඳහා අවශ්‍ය නිලධාරීන් පමණක්

© Prof. Nalin De Silva

නොව භික්ෂූන් වහන්සේලා ද අමාත්‍යාංශය විසින් ම වැඩම කරනු ලැබී යැයි වාර්තා වෙයි. අද රූපවාහිනී නාලිකාවල පෙනී සිටින භික්ෂූන් වහන්සේ නමක් මෙහි දී ප්‍රධාන ස්ථානය ගෙන ඇත. බුද්ධාගමට එළිය දැක්වීමට විද්‍යාව යොදාගන්නා භික්ෂූන්වහන්සේලාට හා පාසල් පාංශුකූල සඳහා වැඩම කරන භික්ෂූන් වහන්සේලාට මෙතරම් ප්‍රසිද්ධියක් ජනමාධ්‍යයෙන් දෙනු ලබන්නේ කුමකට දැයි අදාළ වැඩසටහන් ඉදිරිපත්කරන්නවුන් ද නොදන්නවා විය හැකි ය. ආයතනයක් හෝ සංස්ථාවක් හෝ විනාශ කළ හැක්කේ ඒ තුලින් ම නියෝජිතයන් යොදාගෙන බව බටහිරයන් නොදන්නවා විය නො හැකි ය.

විශාඛා විද්‍යාලය, ආනන්ද විද්‍යාලය ඇතුළු බෞද්ධ යැයි එකල ව්‍යවහාර වූ පාසල් බෞද්ධ සමිති සමාගම් විසින් රජයට පවරා දෙනු ලැබුයේ මහත් උනන්දුවකින් ය. 1962 පාසල් රජයට පවරාගැනීමේ පනත මෙරට බෞද්ධයන්ගේ ඉල්ලීම මත ම ගෙන එන ලද්දක් විය. බෞද්ධයන්ට අවශ්‍ය වූයේ විවිධ ආගමික පාසල් ඔස්සේ කරගෙන ගිය ජාතිකත්වයට එරෙහි වූ ක්‍රියා මාර්ග හා බෞද්ධයනට වූ අසාධාරණය නැතිකිරීමට ය. එහෙත් සිදු වූයේ අනෙකකි. බෞද්ධ පාසල් සියල්ලම පාහේ රජයට පවරා දුන් නමුත් ක්‍රිස්තියානි කතෝලික හා ඉස්ලාම් ආගමික පාසල් සම්බන්ධයෙන් ඒ එසේ ක්‍රියාත්මක නො වී ය. අද සිදුවන්නේ රජයට පවරාගත් බෞද්ධ යැයි සම්මත පාසල්වල යම් බෞද්ධකමක් හෝ ඉතිරි වී ඇත්නම් එය ද නැතිකර දැමීම ය.

මල්වතු මහානායක හිමියන් වෙනුවෙන් කෙසේ වෙතත් පාප්තුමා වෙනුවෙන් පාංශුකූලයක් රජයේ පාසලක දිය යුතුව තිබිණි නම් අධ්‍යාපන අමාත්‍යාංශයට ඒ සඳහා යොදාගත හැකිව තිබූ පාසල් රාශියක් ම කොළඹ අවට වෙයි. කොළඹ රාජකීය, තර්ස්ටන්, ඉසිපතන, මහානාම, ඩී. එස්. සේනානායක විද්‍යාල ඒ අතර වෙයි. ඒ පාසල්වල බෞද්ධ ශිෂ්‍ය සමිති ද ඇතැයි සිතමි. ආගමික ස්වරූපයක් ප්‍රකාශිත ව නැති මේ පාසල් වෙනුවට ආනන්ද හා විශාඛා විද්‍යාල ම අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරිනියන්ට හා නිලධාරීන්ට මතක් වූයේ කෙසේ ද? ආනන්ද හා විශාඛා විද්‍යාල බෞද්ධ පාසල් යැයි මම නො කියමි. මේ පාසල් සියල්ල ද අනෙක් පාසල් මෙන් ම සංස්කෘතික වශයෙන් ක්‍රිස්තියානි වෙයි. අප රටේ විශ්ව විද්‍යාලවල මෙන්ම පාසල්වල ද මුළුමනින් ම පාහේ උගන්වන්නේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය විසින් සකස් කෙරුණු විෂය නිර්දේශ ය. ඇතැම් පාසල්වල උදේ පන්සිල් ගෙන දවල් යො වද තංපව කියා ළමුන් ගෙදර යන නමුත් ඉගෙන ගන්නේ ක්‍රිස්තියානි අධ්‍යාපනඥයන් විසින් සකස්කරනු ලැබූ විජාතික පාඩම් ය . (මේ විජාතික ක්‍රිස්තියානි අධ්‍යාපනය වෙනුවට ජාතික අධ්‍යාපනයක් මේ මස 30 වැනි දා සිට ලබා දීමට චින්තන පර්ෂදය කටයුතු යොදා ඇත.) ආනන්ද හා විශාඛා ආදී විද්‍යාලවල බෞද්ධ ආරෝපණයක් පමණක් දැකිය හැකි ය. අධ්‍යාපන අමාත්‍යංශයට හා ජනාධිපතිනියට අද අවශ්‍ය වී ඇත්තේ මේ බෞද්ධ ආරෝපණය ද සූරා දැමීමට ය.

1992 දී බටහිර ක්‍රිස්තියානි රටවලින් සංවිධානාත්මක ව මුදල් ලබන ඊනියා රාජ්‍ය නොවන සංවිධාන හා සිංහල බෞද්ධ විරෝධී මහජන පක්ෂයට සම්බන්ධ වී සිටි ඇතැම් පුද්ගලයන් විසින් ලංකාවට ගෙන්වා ඊළම දීම සඳහා ජනාධිපතිනිය බවට පත්කරගනු ලැබූ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය අපට නිතර මතක්කර දෙන කතාවක් නම් බෞද්ධ පාසල් නමින් හෝ වෙනත් ආගමික නමකින් හෝ පාසල් වර්ගයක් මෙරට නැති බව ය. ඇය මේ සඳහන්කරන්නේ රජයේ පාසල් සම්බන්ධයෙන් විය යුත්තේ ඇය ඉගෙනුම ලැබූ ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය තවමත් කතෝලික පාසලක් බැවින් ය. බෞද්ධ සමිති සමාගම් තම පාසල් රජයට පවරා දුන්නේ එතරම් දුර කල්පනාකිරීමෙන් විය නො හැකි ය. මේ පාසල් හරයෙන් බෞද්ධ නොවුවත් මතුපිට බෞද්ධ ආරෝපණයක් සහිත විය. වත්මන් ලංකා රාජ්‍යය යනු ක්‍රිස්තියානි රාජ්‍යයක් මිස බෞද්ධ රාජ්‍යයක් නො වෙයි. බෞද්ධ සමිති සමාගම් තම පාසල් පවරා දුන්නේ අනාගමික යැයි කසිකබල් දේශපාලන විද්‍යාඥයන් ලවා ප්‍රකාශ කරවන එහෙත් සෑම අතකින් ම ක්‍රිස්තියානි වූ රාජ්‍යයකට ය. බෞද්ධ ආරෝපණයක් සහිත පාසල් රජයට පවරා දීම නරින්ට හා නරිච්චියන්ට කුකුලන් භාරදීමක් විය. විශාඛා විද්‍යාලයේ කෙරුණේ පාප්තුමාට පාංශුකූලයක් දීමක් නො වෙයි. එය බෞද්ධ ආරෝපණයක් සහිත පාසල් වෙනුවෙන් කරන ලද පාංශුකූලයක් විය. පාප්තුමා අභාවප්‍රාප්ත වුව ද ඒ වෙනුවට හිට්ලර්ගේ රටේ හමුදාවල සේවය කළ අයකු නව පාප්තුමා ලෙස පත්වී ඇත. බෞද්ධ ආරෝපණයක් ඇති පාසල් වෙනුවට බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ජාත්‍යන්තර පාසල් ඉදිවෙයි.

© Prof. Nalin De Silva